# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**11 ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II**

නම/විභාග අංකය.............................. කාලය: පැය 3යි.

සිංහල භාෂාව හා සාහිත්‍යය - I

උපදෙස්:

(I) සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් ලැබේ.
(II) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.
(III) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

★ අංක 1 සිට 3 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තද කළු අකුරින්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.

(1) බොරු පොරොන්දු දී **<u>අල්ලේ නැටවීමට</u>** සමහරු සූරයෝ ය.
(1) සිතැඟි ලෙස හසුරුවා ගැනීමට (2) බලපෑම් කිරීමට (3) තර්ජනය කිරීමට (4) කරදර කිරීමට

(2) සැමියා ලෙඩ ඇඳට වැටීමෙන් පසු දරුවන් ලොකු මහත් කිරීම සඳහා **<u>ඉර හඳ හා සටන් වදින්නට</u>** ඇයට සිදු විය.
(1) සොබා දහමට පිටුපාන්නට (2) අසල්වාසීන් සමඟ රණ්ඩු කිරීමට
(3) අපමණ දුක් විඳීමට (4) දිවා රෑ නොබලා වැඩ කිරීමට

(3) පොළොන්නරු රාජධානියට **<u>නව එළියක්</u>** ලැබුණේ මහ පැරකුම් රජ සමයේ දී ය.
(1) විදුලි ආලෝකයක් (2) වඩා උසස් දියුණුවක්
(3) පහන් ආලෝකයක් (4) නව විධි ආලෝකයක්

★ අංක 4 සිට 6 තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

(4) එම කැණීම්වලින් හමු වූ පුරාවස්තුවල කාලය.......................... කිරීම ලෙහෙසි පහසු නොවේ.
(1) නිවාරණය (2) නිර්මාණය (3) නිරුද්ධ (4) නිර්ණය

(5) නාට්‍යයක උච්චතම අවස්ථාවේ දී ප්‍රේක්ෂක සිතේ ........................ ඇති වේ.
(1) රසය (2) හාස්‍යය (3) ආතතිය (4) කුතුහලය

(6) භාෂාව මාර්ගයෙන් අපේ ................. පැහැදිලි කොට ගැනීම මෙම වැඩසටහනේ අරමුණ බව ඔහු කීවේය.
(1) නිර්මාණ (2) ගෞරවය (3) අනන්‍යතාව (4) අවතක්සේරුව

(7) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදුණු පද පේළිය තෝරන්න.
(1) නවුකාව, පර්වතය, නර්ථන, භාණ්ඩ (2) සළකයි, සංසරනය, මහල්, ආභාසය
(3) ලක්ෂණ, කුරුලු, පිළිතුරු, කනගාටු (4) විශ්මය, ඌණතාව, තොරන, ජොෂ්ට

(8) එක් එක් වචනවල මුල් අකුරෙහි **දීර්ඝ ඇදය, කෙටි ඉස්පිල්ල, දීර්ඝ පාපිල්ල,** ගැට ඇලපිල්ල පිළිවෙළින් යෙදී ඇති වචනය සහිත පද පේළිය තෝරන්න.

(1) වෑයම, රිලවා, භූගත, ගෘහණිය (2) ඍන, කිරිල්ල, මීරිගම, කෘත්‍රිම
(3) රුවනාර, සීමිත, රූමත්, ඍණ (4) සූකිරි, කාසිය, තීක්ෂණ, හෘදය

(9) අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.

(1) කහපොළ, නාරම්මල, මීරිස්ස, හසලක (2) කඩුවෙල, බත්තරමුල්ල, මාලඹේ, මාරවිල
(3) ලාහුගල, රඹුක්කන, වේයන්ගොඩ, වත්තල (4) ආනමඩුව, කටුවන, හෝමගම, පන්නල

(10) 'කතුර' යන පදයෙහි අන්තර්ගත **ව්‍යඤ්ජන අක්ෂර** වර්ග වනුයේ,

(1) ඕෂ්ඨජ, දන්තජ, මූර්ධජ (2) කණ්ඨජ, දන්තජ, තාලුජ
(3) කණ්ඨජ, දන්තජ, මූර්ධජ (4) ඕෂ්ඨජ, මූර්ධජ, දන්තජ

(11) අනුක්ත නාම පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මං, දැරියක, ඔවුන්, සතුරන් (2) තොප, ධනවතුන්, වීරයෙක්, සිසුන්,
(3) මිනිසුන්, කිසිවෙකු, ඇතැමෙක්, සමහරුන් (4) ගැහැනිය, කුමරියක්, හේ, මුවකු

(12) මුල් පදයේ නිවැරදි විසන්ධිය **නොදැක්වෙන** වරණය කුමක්ද?

(1) කාලෝචිත - කාල + උචිත (2) ප්‍රස්තාවෝචිත - ප්‍රස්තා + උචිත
(3) අමාත්‍යාංශය - අමාත්‍ය + අංශය (4) ස්වෝත්සාහය - ස්ව + උත්සාහය

(13) **අව්‍ය සමාසයට** නිදසුනක් නොවන්නේ,

(1) සුභද (2) අනුබල (3) අසුර (4) පන්සිල්

(14) 'මම උදෑසන 6.30ට පමණ නිවසින් පිටත් වීමි.' යන වාක්‍යයේ <u>**නිවසින්**</u> යන පදයෙහි විභක්තිය කුමක්ද?

(1) කරණ විභක්තිය (2) අවධි විභක්තිය (3) ආධාර විභක්තිය (4) කර්තෘ විභක්තිය

(15) මුලින් දී ඇති ව්‍යාකරණ වර්ගයට අයත් **නොවන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) සන්ධි - නිලඹර, අනුරුත්, මල්ලත්ත, යාතිකාව (2) සමාස - මවුපිය, අවමංගල, සඳවත, ජනප්‍රිය
(3) තද්ධිත - ගැමියා, ප්‍රවීණත්ව, මැණියෝ, අද්‍යතන (4) කෘදන්ත - සිතීම, නැටුම්, කෙඳිරිලි, අසන්නා

(16) මිශ්‍ර ක්‍රියා පදයක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) එළියක් පෙනෙන විට හිමියනි වෙරළ බඩ (2) කෙළිමින් යති බැඳ බහු රූ
(3) දැඩි වේදනාවෙන් මිරිකී හඬනු ඇසේ (4) අතරමන් වී හුනිමි සිහින සිතිවිලි අතර

★ අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(17) කෝට්ටේ යුගයේ සාහිත්‍යය හදාරණ විට <u>**තත්කාලීන**</u> දේශපාලන තත්ත්වය ද අවධානයට ලක් කළ යුතුය.

(1) සම කාලයට අයත් (2) පෙර කාලයට අයත්
(3) පසු කාලයට අයත් (4) එම කාලයට අයත්

(18) එම සාහිත්‍යය කෘතියේ <u>**සංශෝධිත**</u> පිටපතක් මුද්‍රණය සඳහා සූදානම් කෙරිණි.

(1) අලුතින් කරුණු එක් කරන ලද (2) නව මාදිලියට හැඩ ගැන් වූ
(3) වැරදි හදා නැවත සකස් කරන ලද (4) සම්පූර්ණයෙන් වෙනස් කළ

(19) හොඳින් ඉගෙන ඉහළ වෘත්තීන් හි නිරත දරුවන්ගේ <u>**විප්‍රවාසය**</u> නිසා බොහෝ වියපත් දෙමාපියෝ අසරණ වෙති.

(1) පිටරට වාසය (2) නොසලකා හැරීම (3) අමතක කිරීම (4) පිට මං කිරීම

(20) දී ඇති වචන අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් බැඳී **නොපවත්නා** පද පේළිය වන්නේ,

(1) විලක්කු, ආතුරයා, ගුරුන්නාන්සේ, යාතිකා (2) උප්පිඩ, ඇඳුත්ත, මැඩුවන්, කූටාලම

(3) මාරියාව, මයක්කම, අම්බාවෝ, කලාතයා (4) ඉල්ලම, නාම්බුව, මීරාං, මලුක්කම

(21) එක් එක් පද පේළිවල දී ඇති පද යුගල අතරින් සමානාර්ථ පද යුගලයක් ඇතුළත් **නොවන** පද පේළිය තෝරන්න.

(1) චිරන්තන - පෞරාණික විස්මයාවහ - පුදුම කරවන ආකස්මික - හේතු සහිත

(2) පරිශීලනය - හැදෑරීම ප්‍රහර්ශය - අධික සංතෝෂය අකුස්සෙන් - හෙණ්ඩුවෙන්

(3) නරමුල් - පැසුණු කෙස්, ආපත්ති - ඇවැත් අමර්ෂය - නො ඉවසීම

(4) මෙරමා - අන්‍යයන් අතික්‍රමණය - ඉක්මවීම අප්‍රතිහත - නොපසුබට

(22) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) නෙලුම් - කමල්, පද්ම, පියුම්, තඹර (2) පොළොව - මිහි, වසුන්දරා, ධරණී, භූමිය

(3) රන් - ස්වර්ණ, කාංචන, රජත, කසුන් (4) දිය - ජලය, උදක, අඹ, වතුර

(23) මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් දෙන **උපසර්ග රහිත** පදය ඇතුළත් වරණය තෝරන්න.

(1) දෘශ්‍යමාන - අදෘශ්‍යමාන (2) ආගමන - විගමන

(3) අනිවාර්ය - වෛකල්පිත (4) සංයෝගය - වියෝගය

(24) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.

(1) පූර්ව ක්‍රියාව ද්විත්ව කිරීමෙන් මිශ්‍ර ක්‍රියා සාදා ගත හැකිය.

(2) 'නැටූමු' යනු අතීත කාල, උත්තම පුරුෂ බහුවචන ආඛ්‍යාතයකි.

(3) 'ගොවියා' යනු පුරුෂ ලිංග අනියමාර්ථ ඒකවචනයකි.

(4) 'ඊශ්වර+ය' එක් වූ විට නිර්මාණය වන්නේ 'ඓශ්වර්ය' යන භාවාර්ථ තද්ධිත නාමයයි.

(25) යුගල පදයක් **නොවන** පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) ඇඳපැද, තොවිල්පවිල්, බලගතු, වතුපිටි (2) යාළුමිත්‍ර, ඇලීගැලී, මංමාවත්, වැහිවරුසා

(3) ලටපට, කුලීමලී, ගහකොළ, නැතිනාස්ති (4) බාරහාර, එළිපෙහෙළි, සැරවැර, යාම්ඊම්

★ අංක 26 හා 27 යටතේ දී ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(26) නොගැළපෙන දෙදෙනෙකු එක් කාර්යයක යෙදවීම.

(1) කොහොඹ ගහට කරවිල වැල ගියා වගේ (2) රන්රස සේ

(3) එළ හරකයි මී හරකයි එකට ඈඳුවා වගේ (4) ජාඩියට මූඩිය වගේ

(27) සුළු ප්‍රයෝජනයක් තකා ඊට වඩා වටිනා දෙයක් නැති කිරීම.

(1) අල්ලපු අත්තත් නෑ පය ගහපු අත්තත් නෑ

(2) අටුව කඩා පුටුව හැදුවා වගේ

(3) අඬුව තියෙද්දී අත පුලුස්සා ගත්තා වගේ

(4) ගිය හකුරට නාඩන්නේ තිබෙන හකුර රැක ගන්නේ

(28) 'මිතුරනි' යන පදයේ ප්‍රකෘතිය හා ප්‍රත්‍ය වෙන් කළ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) මිතු + රනි (2) මිතුර + නි (3) මිතුරු + නි (4) මිතුරු + අනි

★අංක 29, 30 යටතේ දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

(29) (1) නෙතක් අද ශිෂ්‍යායාවක් උසස් පෙළ විභාගයෙන් සමත් වෙති.
(2) පැරණි සාහිත්‍ය කලාවෝ භාරතීය ආභාසය ලැබූහ.
(3) අම්මා නොහොත් තාත්තා පාසලේ රැස්වීමට සහභාගී වන්නීය.
(4) අමරදේවයෝ සංගීත විෂයෙහි නිපුණයෙකු විය.

(30) (1) 'මිතුරන් තරගය ජය ගනිති'යි අපි සිතුවෙමු. (2) ගායකයන් වේදිකාවට පිවිසියහ.
(3) ගං වතුරෙන් ගෙවල් දොරවල් රාශියක් යට වූහ. (4) ළමයි තවම පාසලට පැමිණ නැත.

(31) • ඇගේ වත පුන් සඳක් ............ බබළයි.
• සරච්චන්ද්‍ර .............. සිංහබාහු නාට්‍ය රචකයා සම්මානයට පාත්‍ර විය.
• සීගිරි අප්සරාවන් ................ විවිධ අදහස් පළ වී ඇත.
• සිංහයා ............... සිංහධේනුව මුව පැටවා දඩයම් කරයි.

ඉහත වාක්‍යවල හිස්තැනට සුදුසු නිපාත පද අනුපිළිවෙළ කුමක්ද?

(1) මෙන්, නොහොත්, හෙවත්, ගැන (2) මෙන්, හෙවත්, නොහොත්, ගැන
(3) හෙවත්, මෙන්, නොහොත්, ගැන (4) මෙන්, හෙවත්, ගැන, නොහොත්

(32) කථන ව්‍යවහාරයෙන් පවතින පහත සඳහන් වාක්‍ය ලිඛිත වාක්‍යයකට හැර වූ විට පිළිතුර වන්නේ කුමක්ද?
"මේ අය පරදියි කියලා මම හිතන්නේ නෑ"
(1) මොවුහු පරදිති'යි මම නොසිතමි.
(2) මොවුන් පරදිති'යි මම නොසිතමි.
(3) මෙවුහු පරදීවියැ'යි මම නොසිතමි.
(4) මොවුන් පරදිති'යි මා නොසිතමි.

(33) උපමා අලංකාරයක් **රහිත** වරණය තෝරන්න.
(1) ඇත් ගිනි කඳක් සේ කිපි කිපී බුදුන් කරා දිවනුවේ.
(2) ආකාශයේ පිපී වැනී ගිය තරු කැළක් සේ පිරිවරා සිටිනා
(3) ළකල ගුවන් තල සිරියහන නිකසළ
(4) බුදුන්ගේ ආනුභාවයෙන් පොළොව කුඹල් සකක් සේ පෙරළී

(34) ශබ්ද ධ්වනිය වඩාත් ඉස්මතු වී පෙනෙන කවි පදය ඇතුළත් වරණය තෝරන්න.
(1) දුම්බර ලියෝ කර ඔසවා බලන බැලුම්
(2) සඳමඩල වසාගෙන කළු වලාකුළු ඇදිණ
(3) නල බල සසල දළ රළ පෙළ
(4) සුරිඳුනි කඳිර පුර ලැබ දෙනු මැන පිහිට

(35) 'පොල් තෙල් පහන දැල්වීම <u>බොහෝ කලක සිට පැවතෙන</u> සම්ප්‍රදායකි.' යන වාක්‍යයේ ඉරි ඇඳි පදයට ගැළපෙන තනි පදය වන්නේ,
(1) චිරන්තන (2) චිරාගත (3) චිරස්ථිතිය (4) චිරස්ථායි

(36) 'අසන් පත්තිනි දේවතාවී' පදා නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(1) මහගම සේකර (2) මොනිකා රුවන්පතිරණ
(3) ජී. බී. සේනානායක (4) චන්ද්‍රරත්න මානවසිංහ

(37) අසඩක්, නටාලියා, සයිමන්, ෂවුවා, ගෲෂා යන චරිත අන්තර්ගතවන නාට්‍ය කුමක්ද?

(1) නරි බෑනා (2) තල මල පිපිලා (3) හුණුවටයේ කතාව (4) ගුරු තරුව

(38) හේන් ගොවිතැන ආශ්‍රිත ව්‍යවහාරයේ 'මහ එකා' යනු

(1) පිඹුරාය (2) ලොකු අයියා (3) තාත්තා (4) අලියා

(39) පහත දැක්වෙන කවියේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

සුනෙර මතින් අලළන සඳකිරි සයුර
ඉතිර වෙරළ දිව යන මෙන් රළ පතර
පැතිර උදය ගිරි සිරසින් දිලි නොහැර
මිතුර බලා ලව එන සඳ රස් වතුර

(1) මිතුර, මහාමේරුව නමැති මන්ථයෙන් කිරි මුහුද කලඹද් දී වෙරළ ඉතිරී පැන දුවන රළ පතර මෙන් අත් නොහැර දිලිසෙන උදය පර්වතය මුදුනින් එන සඳ රැස් බලන්න.
(2) මිතුර, මහමෙර නම් වූ දණ්ඩෙන් කිරි සයුර කලඹන විට වෙරළ ඉතිරී දිව යන රළ පහර මෙන් අත් නොහැර දිලිසෙන උදය පර්වතය මුදුනින් එන සඳ රැස් බලන්න.
(3) මිතුර, මහාමේරු පර්වතය ආයුධය ලෙස ගෙන ක්ෂීර සාගරය කලඹන විට වෙරළ සීමාව අත් නොහැර පැන දුවන රළ පහර මෙන් උදය පර්වතය මතින් එන සඳ රැස් බලන්න.
(4) මිතුර, මහාමේරු පර්වතය මන්ථය ලෙස ගෙන ක්ෂීර සාගරය කලඹන විට වෙරළ සීමාව අත් නොහැර පැන දුවන රළ පතර මෙන් උදය පර්වතය මතින් එන සඳ රැස් බලන්න.

(40) දී ඇති ඡේදයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

"යම් කතා පුවතක් හෝ සිදුවීමක් ඇසුරෙන් නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේ දී එම කතා පුවතේ හෝ සිදුවීමේ ඇති සෑම අවස්ථාවක් ම හෝ සිද්ධියක් ම යොදා නොගෙන සුදුසු අවස්ථා පමණක් යොදා ගත යුතු ය."

(1) නාට්‍ය පෙළක් නිර්මාණය කිරීමේ දී කතා පුවතේ ඇතුළත් සුදුසු අවස්ථා හා සිදුවීම් පමණක් යොදා ගත යුතු ය.
(2) නාට්‍ය පිටපත් රචනය සඳහා උපයෝගී කරගත යුත්තේ සුදුසු අවස්ථා මත පදනම් වූ සැබෑ සිදුවීම්ය.
(3) සුදුසු අවස්ථා පදනම් කරගත් නාට්‍ය සඳහා කතා පුවතක් තෝරා ගැනීමේ නිදහස නාට්‍ය රචකයාට හිමි වේ.
(4) නාට්‍ය රචකයා හැම විට ම සිත යොමු කරන්නේ නාට්‍ය පෙළේ සුදුසු අවස්ථා හා සිද්ධීන් ගෙනහැර දැක්වීමට ය.

| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | **දෙවන වාර පරීක්ෂණය - 2025** |
| **11 ශ්‍රේණිය** | **සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II** |

නම/විභාග අංකය...............................

සිංහල භාෂාව හා සාහිත්‍යය - II

• ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්,
(අ) අන්තඃස්ථ අක්ෂරයක් ලියා දක්වන්න. (ආ) කණ්ඨ ඕෂ්ඨජ අක්ෂරයක් ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
සීගිරිය ලොව සුපතල ඓතිහාසික රාජදානියක් බව විද්වත්හු පවසති.

(iii) පහත සඳහන් පද නිවැරදි ව විසන්ධි කර ලියන්න.
(අ) දුප්පත් (ආ) සුදුස්සෝ

(iv) පහත දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.
(අ) දුර්ලභ (ආ) ජංගම

(v) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල විභක්තිය ලියන්න.
(අ) ලෝකය **මල්වලින්** අලංකාර වෙයි. (ආ) සැදැහැතියෝ **භික්ෂූන්ට** දන් දෙති.

(vi) පහත සඳහන් වාක්‍යයේ කළු අකුරින් මුද්‍රිත පද අයත් ව්‍යාකරණ වර්ගය සඳහන් කරන්න.
'ඔහු කණ්ඩායමේ සිටින පළපුරුද්දක් සහිත **ජ්‍යෙෂ්ඨ** පන්දු **යවන්නා** ය.'
(අ) ජ්‍යෙෂ්ඨ (ආ) යවන්නා

(vii) පහත සඳහන් යෙදුම්වල පළමුවන වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන ලෙස පළමුවන වචනය හෝ දෙවන වචනය ගළපා ලියන්න.
(අ) චන්ද්‍ර මඬල (ආ) උද්‍යාන බිම

(viii) පහත දැක්වෙන වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර නැවත ලියන්න.
(අ) මම සිරිපා කරුණා කර නැත.
(ආ) සුධීරත් මිතුරාත් දෙමව්පියෝ සමඟ චේදිකා නාට්‍ය නැරඹීමට ගියහ.

(ix) පහත දැක්වෙන වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට හරවා ලියන්න.
(අ) දේශප්‍රේමියෝ දේශය ආරක්ෂා කරති.
(ආ) ගුරුවරු නිරන්තරයෙන් ම ශිෂ්‍යයන් යහමඟට යොමු කරති.

(x) පහත සඳහන් යෙදුම් සඳහා භේන් ගොවිතැන ආශ්‍රිත භාෂා ව්‍යවහාරයේ යෙදෙන වචන ලියන්න.
(අ) පක්ෂීහු (ආ) පාවහන්

(ලකුණු 02 × 10 = 20 යි)

(2) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) වර්තමානයේ යුද ගැටුම්වල දී න්‍යෂ්ටික අවි භාවිතයට තරම් තාක්ෂණය දියුණු වී ඇත. එහි දී අති විශාල ශක්තියක් පිටවන නිසා එක් කුඩා න්‍යෂ්ටික අවියකින් දැවැන්ත හානියක් කළ හැකිය. යම්කිසි පරිසර පද්ධතියකට ගලා එන විෂ සහිත ද්‍රව්‍ය හේතුවෙන් ඒ තුළ ජීවත්වන ජීවීන්ට හෝ භෞතික දේවලට අස්ථායි බව, අපිළිවෙළ, පීඩා සහ අපහසුතා ඇති කරමින් පරිසර දූෂණය වේ. දහස් සංඛ්‍යාත මිනිස් ජීවිත මෙලොවට අහිමි කරමින් සිදු වන ජන සංහරණය නවතාලමින් සංහිඳියාවක් ඇති කිරීමට වහා පියවර ගතයුතු වේ.

(ආ) රටක අනාගතය තීරණය කරන ප්‍රබල සාධකය එරට ළමා පරපුරයි. එහෙත් අද වන විට ළමා පරපුර ඉතා ම කනගාටුදායක තත්ත්වයකට පත් ව තිබේ. දරුවන්ට සිදුවන හිංසා, පීඩා, අපයෝජනය, පැහැර ගැනීම්, අතරමං වීම, ඝාතනය කිරීම් නිරතුරුව ම අසන්නට ලැබේ. මේ මල් කැකුළු රැක ගැනීම අප සියලු දෙනාගේ ම වගකීම වේ. ගුණ ධර්ම පිරුණු සමාජයකට මෙම දරුවන් කැඳවාගෙන යාම අප සියලු දෙනාගේ ම වගකීම විය යුතුය.

(ඉ) ඈත අතීතයේ සිට පැවත ගෙන එන සාම්ප්‍රදායික කාන්තාවගේ කාර්ය භාරය නූතන සමාජ සන්දර්භය තුළ සහමුලින් ම වෙනසකට ලක් ව ඇත. ගෝලීය සමාජ ක්‍රමය හමුවේ විවිධ ස්ථර හා ලොව ප්‍රබලතම ස්ථානවල සිය ආධිපත්‍යය ගොඩ නංවා ගැනීමට කාන්තාව සමත් වී ඇත. තම ස්වාමි දරුවන් රකිමින් ගත කළ සිය ගෘහීය ජීවිතය අවසන් කරමින් සමාජ ප්‍රගමනයේ ප්‍රබලතම සාධකයක් වී හමාරය. කාන්තාව සමාජය තුළ සිය අනන්‍යතාවය ගොඩ නගමින් ලෝකයේ හිනිපෙත්තට ම ගමන් කිරීම අරඹා අවසන් ය.

(ඊ) ජනතාව අතර පෝෂණය වුණු ඔවුන්ගේ කඳුළත්, සිනහවත්, වේදනාවත් සුන්දර අයුරින් විදහාපාන ජන කවිය කාව්‍ය රස ජනනය කිරීමේ ශක්‍යතාවක් හිමිකරගෙන ඇත. එක් එක් ජන කණ්ඩායම් හි බස් වහර පිළිබඳ ව දැන ගැනීමටත් පොදු ජනයාගේ විවිධ ජීවන වෘත්තීන් පිළිබඳ ඉඟියක් ලබා ගැනීමටත් තමා ලද ජීවන අත්දැකීම් උපදේශාත්මක අයුරින් කීමටත් මේ කවි ප්‍රබල සාධකයකි. ගැමි ජනවහර, ගීතවත් බව, අදහස් ප්‍රකාශනය, විරිත, මනා සංයමය ජන කවියේ සුවිශේෂී ලක්ෂණ වේ. එසේ ම සන්නිවේදනය පහසු කර ගැනීමට ද ජන කවි ප්‍රබල පිටිවහලක් වේ.

(ලකුණු 25යි)

(3) පහත දැක්වෙන පාඨය වචන 60-70 අතර වන සේ **සාරාංශ කොට** ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග සඳහන් කරන්න.

මිනිසා හා සතුන් අතර පවතින වෙනස්කම් සමස්තය එක් ව ගත්විට එකී වෙනස වන්නේ සංස්කෘතිය යි. මිනිසා සංස්කෘතික සත්ත්වයෙකි'යි යන්න ලොව පිළිගත් පොදු මතය වේ. මිහිතලය මත ජීවත්වන එකම සත්ත්වයා මිනිසා ය. එය ඔහු සිය පරිණාමයේ දී අත්පත් කරගත් සුවිශාල ජයග්‍රහණයකි. එහෙත් දැන් සමාජය තුළ ජීවත්වන මිනිසා සැබෑ ලෙස ම සංස්කෘතික මිනිසෙක් ද යන පැනය ඔහුගේ ජීවන විලාසය හා රටාව දෙස බැලීමේ දී පැන නගී. සංස්කෘතික මිනිසාගේ ආපසු ගමනක් ගැන සංස්කෘතික පරිහානියක් ගැන සමාජය තුළ ප්‍රබල කතිකාවතක් මතු ව තිබෙන්නේ මේ නිසා ය. මෙහි දී සමහරු අතීත සංස්කෘතික ලක්ෂණවල සිරකරුවන් බවට කැමැත්තෙන් ම පත්ව සිටිය දී තවත් බොහෝ දෙනා සංස්කෘතික පිරිහීමක ගොදුරු බවට පත්වෙමින් සිටිති. එය සමාජයේ යහපත් පැවැත්මට මෙන් ම සමාජ ප්‍රගතියට ද බාධාවක් වේ. සංස්කෘතික මිනිසා පිළිබඳ වඩා පුළුල් හා නිරවුල් සංවාදයක් අවශ්‍ය වන්නේ මේ නිසා ය.

අපේ රට ඇතුළු බොහෝ රටවල් මේ වන විට ඉතා ම දරුණු සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතිකමය අර්බුදයකට මුහුණ දී තිබේ. එබැවින් දැන් අප ජීවත් වන්නේ ආර්ථික හා දේශපාලන වශයෙන් පමණක් නොව සංස්කෘතික වශයෙන් ද අර්බුදයකට ගිය පිරිහුණු රටක ය. එවැනි යුගයක රටක් ආර්ථික හා දේශපාලන වශයෙන් අර්බුදයට ගොස් පිරිහෙන විට එම අර්බුදය හා පිරිහීම සංස්කෘතික ක්ෂේත්‍රය තුළින් ද ප්‍රකාශයට පත් වේ. 'සංස්කෘතික මිනිසා' වෙනුවට නරුමයෙක් හෝ ම්ලේච්ඡයෙක් පෙනෙන්නට පටන් ගන්නේ එවිට ය. රටක්, ජනතාවක් සංස්කෘතික ලෙස පිරිහීමේ ප්‍රධාන හේතුව පවතින්නේ තනි තනි මිනිසුන්ගේ විඥානය තුළ නොව සමාජ අර්ථික දේහය තුළ ය. එබැවින් තාර්කිකව ගත්කළ හොඳ සංස්කෘතික මිනිසෙක් නිර්මාණය වීමට නම් එකී සමාජය ආර්ථික, දේශපාලනික වශයෙන් ද දියුණු වූවක් විය යුතු ය.

(ලකුණු 10යි )

(4) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සමාජය විද්‍යාත්මකව හැදෑරීමට සමාජ විද්‍යාව නම් විෂයය 19 වන සියවසේ දී බිහි විය. බොහෝ සමාජ විද්‍යාඥයන් තම විෂය පරිචය හා මතවාද ඔස්සේ සමාජ විද්‍යාව යනු කුමක් ද? යන්න නිර්වචනය ඉදිරිපත් කොට ඇත. කිංස්ලි ඩේවිස්, එච්. පී. ෆෙයාචයිල්ඩ්, ජ්. ඩබ්. ස්ටෙල්, එමිල් ඩුර්කහයිම්, මැක්ස් වේබර් යන සමාජ විද්‍යාඥයන්ගේ සියලු නිර්වචනයන්හි සන්දර්භය වන්නේ "මානව පරිසරය හා එහි ඇති අන්‍යොන්‍ය සම්බන්ධතාව සේ ම සමාජ ආයතන ඇතුළු සියලු සමාජ සබඳතා හා ගැටළු විද්‍යාත්මකව හදාරණ විෂය සමාජ විද්‍යාව ලෙස අර්ථ ගැන්විය හැකිය." මෙහි දී සමාජ විද්‍යාව තුළ වඩාත් ම ක්‍රියාකාරිකයකු වූ එමිල් ඩුර්කහයිම් සමාජ පරිණාමය, ආගමික, අධ්‍යාපනය හා සියදිවි නසා ගැනීම ආදිය පිළිබඳ සමාජ විද්‍යාත්මක ව අධ්‍යයනය කර සමාජ විද්‍යා විෂය අනුභූතිය නව මාවත් තුළ තැබීමට උත්සාහ දැරීය. කාර්මීකරණය හා නාගරීකරණය තුළින් සමජ පරිණාමය අධ්‍යයනය කළ සමාජ විද්‍යාඥයින් ආර්ථික වර්ධනය, ආගමික ප්‍රතිසංස්කරණය, තාක්ෂණික දියුණුව, ලිබරල්වාදී දේශපාලන ක්‍රමය හා යන්ත්‍ර සූත්‍ර භාවිතයෙන් යුතු මහා කර්මාන්ත ශාලා නිර්මාණය වීම ආදිය සමාජ පරිණාමයට හේතු වූ බව නිගමනය කරන ලදී.

(i) සමාජ විද්‍යාව බිහිවීමේ අරමුණ කුමක් ද?
(ii) සමාජ විද්‍යා නිර්වචනය ඉදිරිපත් කළ සමජ විද්‍යාඥයින් දෙදෙනෙක් නම් කරන්න.
(iii) සමාජ විද්‍යා විෂය අනුභූතිය නව මාවතක් තුළ තැබීමට සමජ විද්‍යාත්මක ව අධ්‍යයනය කරන ලද්දේ කුමන ක්ෂේත්‍රයන් ද?
(iv) ඡේදයේ සඳහන් සමාජ පරිණාමයට හේතු වූ කරුණු 2ක් ලියන්න.
(v) **<u>නිර්වචන</u>, <u>අන්‍යොන්‍ය සබඳතා</u>** යන යෙදුම් අර්ථ දක්වන්න.

(ලකුණු 2×5 = 10යි)

(5) පහත සඳහන් විස්තරය පදනම් කරගෙන **රාජකාරී ලිපියක්** ලියන්න.

ඔබේ පාසලේ පරිසර සංගමය මෙවර ලෝක පරිසර දිනය වෙනුවෙන් විද්‍යාල භූමියෙහි ඖෂධ උයනක් සැකසීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටී. මෙහි දී විවිධ ආකාරයේ ඖෂධ පැළ 200ක් පමණ රෝපණය කිරීමට නියමිතය.

මේ සඳහා අවශ්‍ය උපදෙස් හා නිර්දේශ කළ හැකි ඖෂධ පැළෑටි නාමාවලියක් පිළිබඳ තොරතුරු ඉල්ලා ගම්පහ පළාත් ආයුර්වේද කොමසාරිස්තුමා වෙත යැවීමට සුදුසු ලිපියක් ලියන්න. ඔබ පරිසර සංගමයේ ලේකම් හේරත් බණ්ඩාර යැයි සිතන්න. (මේ සඳහා වචන 100ක් පමණ සෑහේ)

(ලකුණු 15යි)

නැතහොත්

පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන **අත්පත්‍රිකාවක්** සකස් කරන්න.

නිල්පනාගොඩ 'ජනජය' මුද්‍රණාලයට හා පොත්හලට වසර 10ක් පිරීම නිමිත්තෙන් පොත් ප්‍රදර්ශනයක් හා අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනයක් පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කොට ඇත. විශේෂ වට්ටම් හා සුවිශේෂී වාසි රැසක් සහිතව පවත්වන මෙම ප්‍රදර්ශනය එළඹෙන අගෝස්තු මස පළමු වන දා සිට උදෑසන 9.30 සිට රාත්‍රී 8.00 දක්වා දින පහක් පුරාවට පැවැත් වේ. ඔබ එම ආයතනයේ වෙළඳ කළමනාකරු නිපුන ජයවර්ධන යැයි සිතන්න. (මේ සඳහා වචන 100ක් පමණ සෑහේ)

(ලකුණු 15යි)

★★★